**ජාතික මූලික අධ්‍යයන ආයතනය - 2016**
**------------------------------------------**

**ජාතික මූලික අධ්‍යයන ආයතනයේ 2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1981 අංක 55 දරන ජාතික මූලික අධ්‍යයන ආයතන පනතේ 36(4) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර, ආයතනයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත් කළ යුතුයැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.**

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**
**-------------------------------------------------------------**

**මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.**

**1.3 විගණකගේ වගකීම**
**----------------------**

**මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.**

**මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ආයතනයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ආයතනයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමණාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.**

**මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.**

**1.4** **තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

---------------------------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

**2.** **මූල්‍ය ප්‍රකාශන**

-------------------

**2.1** **තත්ත්වාගණනය කළ මතය**

-----------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2016 දෙසැම්බර් 31 දිනට ජාතික මූලික අධ්‍යයන ආයතනයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**2.2** **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

----------------------------------------

**2.2.1** **ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති**

-------------------------------------------

ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07 ප්‍රකාරව ජංගම නොවන වත්කම් සඳහා ඵලදායී ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් පිරිවැය රු. 79,737,220 ක් වූ ස්ථාවර වත්කම් අයිතම 15 ක් සම්පූර්ණයෙන් ක්ෂය කර ඇතත් තවදුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවතුණි. ඒ අනුව වූ ඇස්තමේන්තුගත දෝෂය ප්‍රමිති 03 ප්‍රකාරව ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි.

**2.2.2** **ගිණුම්කරණ අඩුපාඩු**

----------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු. 4,148,299 ක් වූ ලැබිය යුතු ස්ථාවර තැන්පතු පොලිය රු. 4,521,733 ක් ලෙස මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ හා මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයේ දක්වා තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ මැයි 05 දින රු.1,200,000 ක් වැයකර මිලදීගෙන තිබුණු රසායනාගාර උපකරණයක් සඳහා භාවිතා කරන උපාංග, යන්ත්‍ර හා උපකරණ යටතේ ප්‍රාග්ධනිත කළ යුතු වුවද සමාලෝචිත වර්ෂයේදී අයභාර වියදම් ලෙස ගිණුම්ගත කර තිබුණි.

**2.2.3** **විගණනය සඳහා සාක්ෂි නොවීම**

-----------------------------------

සමාලෝචිත වර්ෂයේ එකතුව රු. 549,279,345 ක් වූ ගිණුම් විෂයන් 02 ක් සම්බන්ධයෙන් ඒවා ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

| | විෂයය | වටිනාකම | ඉදිරිපත් නොකළ සාක්ෂි |
|---|---|---|---|
| | | රු. | |
| (අ) | ස්ථාවර වත්කම් | 524,363,994 | ස්ථාවර වත්කම් ලේඛනය |
| (ආ) | ජංගම වත්කම් යටතේ දක්වා ඇති රසායනාගාර උපකරණ මෙවලම් හා ලී බඩු | 24,915,351 | පැවැත්ම තහවුරු කිරීමේ සාක්ෂි |
| | | 549,279,345 | |

## 2.3 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති රීති, රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| (i) මුදල් රෙගුලාසි 103 | * සමීක්ෂණ මණ්ඩලය විසින් අස්ථාන ගත වී ඇති ලෙසට (Untraceable) හඳුනා ගෙන ඇති වටිනාකම රු. 4,772,606 ක් වූ අයිතම් 143 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.<br>* 2016 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණයේ දී ඌනතා ලෙස හඳුනාගත් පොත් 809 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |
| (ii) මුදල් රෙගුලාසි 135 | සමාලෝචිත වර්ෂයේදි ජාතික මූලික අධ්‍යයන ආයතනය විසින් රු.358,285,716 ක වියදමක් සිදු කර තිබුණත්, මුදල් රෙගුලාසි ප්‍රකාරව මූල්‍ය බලතල පවරා නොතිබුණි. |
| (iii) මුදල් රෙගුලාසි 137 | වටිනාකම රු.12,881,992 ක් වූ ගෙවීම් වවුචර් 02 ක් අනුමත කිරීමකින් තොරව ගෙවීම් කර තිබුණි. |
| (iv) මුදල් රෙගුලාසි 139 | සමාලෝචිත වර්ෂයේ වටිනාකම රු.429,652 ක් වූ ගෙවීම් වවුචර් 05 ක් නියෝජ්‍ය ගණකාධිකාරිවරියගේ සහතිකය නොමැතිව ගෙවීමට කටයුතු කර තිබුණි. |

| | | |
|---|---|---|
| (v) | මුදල් රෙගුලාසි 225 | සාමාන්‍ය ගෙවීම සඳහා පොදු 35 ආකෘති පත්‍රය නිවැරදි ලෙසත්, සම්පූර්ණ ලෙසත් පුරවා පිළියෙල කළ යුතු අතර සාමාන්‍ය ගෙවීම් වවුචර් ආකෘති පත්‍රයෙහි නිර්දේශය හා අනුමැතිය අදාළ නිලධාරින්ගේ අත්සන හා රබර් මුද්‍රාව යොදා තහවුරු කළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂයේ ගෙවීම් කර තිබූ වවුචර් 2715 ක් සඳහා ඉහත පරිදි කටයුතු කර නොතිබුණි. |
| (vi) | මුදල් රෙගුලාසි 371(2) | සුළු මුදල් අග්‍රිමයෙන් එකවර රු.5,000 කට වඩා නොගෙවිය යුතු වුවත්, ඊට පටහැනිව අවස්ථා 04 කදී රු.7,500 හා රු. 12,000 අතර පරාසයක් තුළ ගෙවීම් කර තිබුණි. |
| (ආ) | 1958 අංක 15 දරන සේවක අර්ථසාධක පනත හා 2001 අගෝස්තු 24 දිනැති අංක ප්‍ර/ආයතන/11 දරන කම්කරු කොමසාරිස්ගේ ලිපිය | සේවක අර්ථසාධක අරමුදලට හා සේවා නියුක්තිකයින්ගේ භාර අරමුදල් දායකත්වයට අධ්‍යයන දීමනා අදාළ කර නොගත යුතු වුවත්, ඊට පටහැනිව අධ්‍යයන දීමනාව පදනම් කර ගැනීම හේතුවෙන් ආයතනයේ දායකත්වය ලෙස රු.3,011,258 ක් වැඩිපුර ගෙවීම් කර තිබුණි. |
| (ඇ) | 2009 නොවැම්බර් 13 දිනැති අංක 438 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | රු. 7,977,978 ක් වටිනාකමැති භාණ්ඩ අවිධිමත් ලෙස භාවිතයෙන් ඉවත් කර, අනාරක්ෂිතව ආයතන පරිශ්‍රයේ ගොඩගසා තිබුණි. |

3. මූල්‍ය සමාලෝචනය
-----------------------

3.1 මූල්‍ය ප්‍රතිඵල
--------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රතිඵලය රු. 44,817,129 ක ඌනතාවයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු. 50,269,507 ක් විය. ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.5,452,378 ක වර්ධනයක් පෙන්නුම් කෙරුණි. ඒ අනුව ඉකුත් වර්ෂයට සාපේක්ෂව සේවක පාරිශ්‍රමික රු.9,220,529 කින් වැඩි වී තිබුණ ද පුනරාවර්තන ප්‍රදාන රු.27,000,000 කින් වැඩිවීම ඉහත වර්ධනය සඳහා ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂ 04 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2012 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වාම ඌනතාවයක් ඇති වී තිබූ නමුත්, සේවක පාරිශ්‍රමික සහ ජංගම නොවන වත්කම් සඳහා වූ ක්ෂයවීම් සැලකීමෙන් පසු 2012 වර්ෂයේ රු. 72,927,520 ක් වූ ආයතනයේ දායකය 2016 වර්ෂයේදී රු. 125,454,329 ක් වී තිබුණි.

4. මෙහෙයුම් සමාලෝචනය
-----------------------------

4.1 කාර්යසාධනය
-------------------

1981 අංක 55 දරන ජාතික මූලික අධ්‍යයන ආයතන පනත අනුව ආයතනයේ අරමුණු පහත දැක්වේ.

- ගණිතය, භෞතික හා රසායන විද්‍යාවන්, ජීව විද්‍යාවන්, සමාජ විද්‍යාවන් සහ දර්ශනය යන විෂයයන් පුළුල්ම අර්ථයෙන් ගෙන, එම විෂයයන් කෙරෙහි විශේෂ අවධානයක් ඇතිව සාමාන්‍ය වශයෙන් මූලික අධ්‍යයන පිළිබඳව පර්යේෂණ සහ මුල් විමර්ශන ආරම්භ කිරීම, වැඩිදියුණු කිරීම සහ පැවැත්ම.

- ආයතනයේ ශාස්ත්‍රීය වැඩකටයුතු ඉදිරියට ගෙනයාම පිළිබඳ සහ විද්‍යා දැනුම ව්‍යාප්ත කරනු පිණිස දේශන, රැස්වීම්, සම්මන්ත්‍රණ සහ සාකච්ඡා, සමුළු සංවිධානය කිරීම.

- ශ්‍රී ලංකාව ඇතුළත සහ විදේශවල නිර්මාණාත්මක කාර්යයන්හි නිරතව සිටින විද්‍යාඥයින්ට දේශන පැවැත්වීමට සහ ආයතනයේ පර්යේෂණ කටයුතුවලට සහභාගීවීමට ඇරයුම් කිරීම.

- ජාතික යහපත ආරක්ෂා කිරීමට සහ වර්ධනය කිරීමට වගබලා ගන්නා අතරම වෙනත් රටවල විද්‍යා කටයුතුවල නියුක්ත තැනැත්තන් සහ විද්‍යා ආයතන සමඟ සබඳතා ඇතිකර ගැනීම සහ පවත්වා ගෙන යාමද ආයතනයේ අරමුණු සහ පරමාර්ථවලට අදාළ කරුණු සම්බන්ධයෙන් අන්තර්ජාතික සහයෝගිතාව ඇති කිරීම.

- ආයතනයේ අරමුණු හා පරමාර්ථ මුදුන්පත් කිරීම සඳහා අවශ්‍යවන වෙනත් ක්‍රියා හා දේ කිරීම.

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය වන විට ජාතික මූලික අධ්‍යයන ආයතනය පිහිටුවා වර්ෂ 30 ක පමණ කාලයක් ගත වී ඇති අතර, ආයතනය විසින් ලබාගෙන ඇති පේටන්ට් බලපත්‍ර ගණන 11 ක් විය. නමුත් ශ්‍රී ලංකාව තුළ ආර්ථිකමය හා වාණිජ කටයුතු සඳහා භාවිත කර තිබුණේ ඉන් එක් බලපත්‍රයක් පමණි.

(ආ) 1987 සහ 1988 වර්ෂවලදී Super Phosphate, Ammonium Phosphate පොහොර නිෂ්පාදනය සඳහා පිළිවෙලින් අංක 9772 සහ 9873 දරන පේටන්ට් බලපත්‍ර ලබාගෙන ඇතත්, 2017 වර්ෂය වන විටත් ඒවා ප්‍රායෝගිකව ක්‍රියාත්මක කර නොමැති අතර, ශ්‍රී ලංකාව එකී පොහොර ආනයනය කිරීම සඳහා විශාල විදේශ විනිමයක් වැය කරන බව නිරීක්ෂණය කෙරේ.

4.2 මෙහෙයුම් ක්‍රියාකාරකම්
----------------------------

2013 හා 2015 වර්ෂයන්හි විදේශ ආයතනයකින් පුස්තකාල පොත්, රසායන ද්‍රව්‍ය සහ වෙනත් උපකරණ මිලදී ගැනීම සඳහා එකතුව රු.100,591 ක්වූ අත්තිකාරම් මුදලක් අවස්ථා 02 කදී ලබා දී වර්ෂයකට අධික කාලයක් ගත වී ඇතත්, එම උපකරණ හෝ පොත් ගෙන්වා ගැනීමට කටයුතු කර නොතිබුණි.

**4.3** මතභේදයට තුඩුදෙන ගනුදෙනු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) විධිමත් පරිදි පවරා නොගත් මහවැලි අධිකාරියට අයත් ආයතනයේ නිලධාරීන් විසින් භාවිතා කරන නිල නිවාස සඳහා ගෙවිය යුතු නිවාස කුලී රු. 160,570 ක මුදල පදිංචි නිලධාරීන්ගෙන් අයකර, අදාළ ආයතනයට ගෙවිය යුතු වුවද රු.101,000 ක් සමාලෝචිත වර්ෂයේදී ආයතනයේ අරමුදලින් ගෙවීම් කර තිබුණි.

(ආ) පෞද්ගලික ආයතනයක් විසින් පිවිසුම් මාර්ගයෙහි ඉදිකිරීම් කටයුතු සඳහා බිම සකස් කිරීමේදී ටෙලිකොම් සමාගමේ කේබලයකට හානි සිදුකිරීම හේතුවෙන් ටෙලිකොම් සමාගම විසින් ඇස්තමේන්තු කළ අලාභය වූ රු.658,744 ක් කොන්ත්‍රාත්කරුගෙන් අයකළ යුතු වුවද එය මූලික අධ්‍යයන ආයතනය විසින් ගෙවා තිබුණි.

**4.4** අරමුදල් ඌන උපයෝජනය

සමාලෝචිත වර්ෂය තුළ රාජ්‍ය ප්‍රාග්ධන ප්‍රදාන ලෙස ලැබුණු රු. 144,999,579 ක මුදලින් රු.85,975,718 ක ශේෂයක් හා ඉකුත් වර්ෂවලදී ලැබී තිබූ ප්‍රදානවලින් රු.45,253,912 ක් අදාළ අරමුණු සඳහා යෙදවීමකින් තොරව වියදම් නොකළ රාජ්‍ය ප්‍රදාන යටතේ දක්වා තිබුණි.

**4.5** නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

2015 පෙබරවාරි 16 දින රු. 1,200,000 කට ප්‍රත්‍යාගණනය කළ කැබ් රථයක් 2016 ජනවාරි 21 දින සිට විගණිත දිනය දක්වාම භාවිතයෙන් ඉවත් කර ආයතන පරිශ්‍රයේ නවතා තිබුණි.

**4.6** ප්‍රසම්පාදන සහ කොන්ත්‍රාත් ක්‍රියාවලිය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2014 අංක 33 දරන ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන පනතෙහි XI කොටසේ 55(ඊ) ඡේදය පරිදි රාජ්‍ය හෝ අර්ධ රාජ්‍ය සියළුම ආයතන ඉදිකිරීම් කටයුතු සඳහා නිශ්චිතව හඳුන්වා දී ඇති ආකෘති භාවිතා කළ යුතු වුවත්, ජාතික මූලික අධ්‍යයන ආයතනය එකතුව රු.43,985,981 ක ඉදිකිරීම් කටයුතු සඳහා නිශ්චිත ගිවිසුම් ආකෘති භාවිතා නොකර අවිධිමත් ගිවිසුම්වලට එළඹ තිබීම නිසා අතහැර දැමූ ඉදිකිරීම් හා ප්‍රමාද වූ ඉදිකිරීම් ආදියට නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට හෝ දඩ මුදල් අයකර ගැනීමට නොහැකි වී තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ වැඩ ආරම්භ කර මාස 04 ක කාලයකින් අවසන් කළ යුතු කොන්ත්‍රාත් 06 ක් වෙනුවෙන් වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් වශයෙන් රු.13,855,793 ක් ගෙවා තිබුණි. වසරකට අධික කාලයක් ගතවී ඇතත් එම කොන්ත්‍රාත්වල වැඩ අවසන් කර නොතිබුණු අතර කොන්ත්‍රාත්තුවල කාලය දීර්ඝ කර ගැනීමටද කටයුතු කර නොතිබුණි. වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් සඳහා ඉදිරිපත් කර ඇති බැඳුම්කරවල කාලය ඉක්ම ගොස් ඇති අතර තවදුරටත් පවතින වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් රු.13,855,793 ක මුදල අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අත්පොතෙහි 7.9.2(ජේ) වගන්තිය පරිදි විශාල මිල පරතරයක් සහිත ලංසු ඉදිරිපත් වී ඇති විට එක් එක් වැඩ අයිතමය සඳහා අනෙකුත් ලංසුකරුවන්ගේ මිල ගණන් හා ඉංජිනේරු ඇස්තමේන්තුවේ මිල ගණන් සංසන්දනය කරමින් ඇගයීම සිදු කළ යුතුය. එහෙත් ඉංජිනේරු ඇස්තමේන්තු පිරිවැය රු. 5,472,685 ක් වූ ඉදිකිරීම් කොන්ත්‍රාත්තුව සඳහා ලංසු ඇගයීමේදී එක් එක් අයිතම ඇගයීමට ලක් නොකිරීම හේතුවෙන් මිල ප්‍රමාණ පත්‍රයේ අයිතම අංක 24 සඳහා අනෙක් ලංසුකරුගේ මිලට සියයට 6700 ක් හා ඉංජිනේරු ඇස්තමේන්තුවේ සඳහන් මිලට සියයට 90 ක් අඩුවෙන් මිල ඉදිරිපත් කිරීම නිසා සුදුසුකම් ලැබූ ලංසුකරු වෙත රු. 5,481,618 කට එම ඉදිකිරීම පවරා තිබුණි.

(ඈ) ජාතික මූලික අධ්‍යයන ආයතනයේ නව ගොඩනැගිල්ල ඉදිකිරීමේ දී පර්යේෂණ විද්‍යාගාර සඳහා මුලදී සැලසුම් කළ පරිදි වැර ගැන්වීම් යොදා කොන්ක්‍රීට් මේස ඉදිකිරීමට වර්ග අඩි 420 ක් වෙනුවෙන් රු.4,620,420 ක් ගෙවා තිබුණත්, පසුව ඒවා පර්යේෂණ කටයුතු සඳහා ප්‍රමිතියට අනුකූල නොවන බව දක්වා කොන්ක්‍රීට් මේස කඩා ඉවත් කර ඒ වෙනුවට දැවමය (Wooden) මේස සෑදීම හේතුවෙන් ආයතනයට කොන්ක්‍රීට් මේස ඉදිකිරීමට වැයකළ රු.4,620,420 ක මුදල මූල්‍යමය පාඩුවක් වී තිබුණි.

(ඉ) ජාතික මූලික අධ්‍යයන ආයතනයේ ඉදිරිපස මිදුලෙහි වර්ග මීටර් 675 ($675m^2$) භූමි ප්‍රදේශයේ කොන්ක්‍රීට් ගල් ඇතිරීම සඳහා සමාලෝචිත වර්ෂයේදී රු.814,925 ක් වියදම් දරා තිබුණි. එනමුත් විගණන අවස්ථාව වන විට එම ගල් අතුරා තිබූ ප්‍රදේශයේ බොහෝමයක් ස්ථාන ගිලා බැසීමට ලක් වී තිබූ අතර, එම ස්ථානවල ජලය රැදී තිබුණි. තවද එම ප්‍රදේශයේ එකතුවන ජලය ගලා යාම සඳහා විධිමත් පරිදි බිම් සැකසීමටද කටයුතු කර නොතිබුණි.

## 4.7 කාර්ය මණ්ඩල පරිපාලනය

2017 මාර්තු 09 දින වන විට පර්යේෂණ කාර්ය මණ්ඩලයේ නිලධාරීන් 20 දෙනකුගේ පුරප්පාඩු පැවතීම මත මෙම ආයතනයේ අරමුණු ප්‍රශස්ථ මට්ටමෙන් ලඟාකර ගැනීමට බාධාවක්ව පැවතුණි.

## 5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

## 5.1 අයවැය ලේඛනමය පාලනය

සමාලෝචිත වර්ෂයේ අයවැයගත ආදායම හා වියදම, තත්‍ය ආදායම් හා වියදම් සමඟ සැසඳීමේදී අයිතම 14 ක සියයට 6 ක සිට සියයට 1684 ක විචලනයක් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී පාලන කාරකයක් ලෙස යොදා ගෙන නොතිබුණි.

## 6. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන දූර්වලතා අවස්ථා කිහිපයකදී අධ්‍යක්ෂවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතු වේ.

| | පද්ධති හා පාලන ක්ෂේත්‍ර | | නිරීක්ෂණ |
|---|---|---|---|
| (අ) | ගිණුම්කරණය | - | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අනුගමනය නොකිරීම. |
| (ආ) | තොග පාලනය | (i) | සෙමින් චලනයවන තොග සහ නිශ්ක්‍රීය තොග සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු නොකිරීම. |
| | | (ii) | රසායන ද්‍රව්‍ය සහ විද්‍යාගාර උපකරණ මිලදී ගැනීමේ කටයුතු සම්බන්ධයෙන් අභ්‍යන්තර පරීක්ෂාවන් ඇතිවන පරිදි වැඩ බෙදා දීමක් සිදුකර නොතිබීම. |
| (ඇ) | කොන්ත්‍රාත් කටයුතු | - | නීති, රීති හා රෙගුලාසි අනුගමනය නොකිරීම හා නිසි අධීක්ෂණයෙන් බැහැරව කටයුතු කිරීම. |
| (ඈ) | වාහන පාලනය | - | වාහන පාලනය සහ වාහන අලුත්වැඩියා කිරීම් සම්බන්ධ සියලු කටයුතු එක් නිලධාරියෙකු විසින් සිදුකිරීම හේතුවෙන් නිසි අභ්‍යන්තර පරීක්ෂාවක් ක්‍රියාත්මක නොවීම. |
| (ඉ) | සේවක මණ්ඩල කළමනාකරණය | - | අභ්‍යන්තර පරීක්ෂාවන් ඇතිවන පරිදි වැඩ බෙදා දීමක් සිදු කර නොතිබුණි. |